2009 සැප්තැම්බර් 09 දින,

ගරු සුසිල් ප්‍රේම්ජයන්ත මහතා
ලේකම්
එක්සත් ජනතා නිදහස් සන්ධානය

මහත්මයාණෙනි,

**පළාත් සභාවලට නාම යෝජනා ලබා දීම පිළිබඳව**

පසුගිය පළාත් සභා මැතිවරණවලදී මෙන්ම මෙවර දකුණු පළාත් සභා මැතිවරණය සඳහා ද නාම යෝජනා ලබා දීමේදී, පක්ෂය තුළ ක්‍රියාකාරී වැඩ කොටසක් කරමින් පක්ෂය ඉදිරියට ගෙනයාමට කටයුතු කළ පිරිස් අමතක කර දමා සෘජුව දේශපාලනයට සම්බන්ධකමක් නැති, ඒ පිළිබඳ හරිහැටි අවබෝධයක් නැති නමුත් සමාජයේ ප්‍රසිද්ධ, යම් නමක් හිමිකරගත් පුද්ගලයන්ට එම අවස්ථාව ලබා දීමේ ප්‍රවනතාවක් අපට දක්නට ලැබී ඇත. මෙය පසුගිය සබරගමු පළාත් සභා ඡන්දය තුළදීත් බස්නාහිර පළාත් සභා ඡන්දය තුළදීත්, මෙවර දකුණු පළාත් සභා ඡන්දය තුළදීත්, අපට දකින්නට ලැබුණි.

මෙහිදී අපගේ බලවත් කණගාටුවට හේතු වන කරුණු වනුයේ එසේ දේශපාලනයට පිටතින් පැමිණෙන පිරිමි අපේක්ෂකයන්ට සාපේක්ෂව කාන්තා අපේක්ෂිකාවන්ට තම ලිංගිකත්වය පදනම් කරගනිමින් එල්ලවන නොයෙකුත් මඩ ප්‍රචාරණයන්ය. පුරුෂ පක්ෂයට ඔවුන්ගේ ලිංගිකත්වය, පෞද්ගලික ජීවිතය ආදිය ඈදාගනිමින් කරන මඩ ප්‍රහාරයන් ඉතාමත් අල්ප වන අතර කාන්තාවක් දේශපාලනයට පිවිසීමේ දී ඇයගේ පෞද්ගලික ජීවිතය අළලා කරන මඩ ප්‍රහාරයන් එහි අනිවාර්ය සාධකයක් බවට පත් වී ඇත. මෙය දේශපාලනය තුළ කාන්තා නියෝජනය අඩුවීමට බලපෑ ඇති ප්‍රධාන සාධකයක් බව අපේ හැඟීමයි.

මෙවර දකුණු පළාත් සභා ඡන්දයට ඔබ සන්ධානයෙන් නිළියන් දෙදෙනෙකු අපේක්ෂිකාවන් වශයෙන් ඉදිරිපත් කරමින් දේශපාලනයේ කාන්තා නියෝජනය වැඩි කිරීමට උත්සාහ කිරීම පිළිබඳව අපේ සතුට පළකරන අතරම ඉන් එක් අපේක්ෂිකාවක් වන අනර්කලී ආකර්ශා පිළිබඳව මැතිවරණ වේදිකාවල, පුවත්පත්වල හා නොයෙකුත් වෙබ් අඩවිවල සිදු කරන චරිත ඝාතනයන්, මඩ ප්‍රහාරයන් අපි දැඩිව හෙළා දකිමු.

කාන්තාවන්ගේ දේශපාලන සහභාගිත්වය නගාසිටුවීම සඳහා දිගුකාලයක සිට කටයුතු කරන කාන්තා සංවිධානවල ක්‍රියාකාරින් වන අප මේ පිළිබඳව දැඩි කණගාටුවට පත්ව සිටින අතර ඔබ පක්ෂයට ද මෙම තත්ත්වය අහිතකරව බලපාන බව අපෙගේ හැඟීමයි.

කාන්තාවක් හෝ පුරුෂයෙක් හෝ වේවා මොනයම් හෝ වෘත්තියක නියැලීමේ දී ඔවුන්ට ඒ පිළිබඳ මනා දැනුමක්, පළපුරුද්දක් තිබීම අත්‍යාවශ්‍ය සාධකයකි. ඒ අනුව දේශපාලනය තුළදී වුවත් එම තත්ත්වය සැමට පොදු කරුණක් වන්නේ නම්, දේශපාලනය පිළිබඳ ජනතාව තුළ යම් ගරුත්වයක්, විශ්වාසයක් ඇතිවනු නොඅනුමානය. ඒ අනුව අදාළ ප්‍රදේශය තුළ යම් ක්‍රියාකාරී වැඩ කොටසක් ඉටුකළ කාන්තා හෝ පිරිමි දෙපාර්ශවයටම යම් සාධාරණ ක්‍රමයකට නාම යෝජනා ලබා දීමේ වැඩ පිළිවෙළක් පක්ෂය තුළ ක්‍රියාත්මක කිරීම මඟින් මෙවැනි අපහසුතා වළක්වා ගත හැකි බව අපගේ අදහසයි.

එවිට දේශපාලනයට පිවිසෙන කාන්තාවන්ට අනවශ්‍ය හිරිහැර කරදරවලට ලක් වීමට සිදු නොවන අතරම කාන්තාවන් දේශපාලනයට පිවිසීම ඇතැම් ජනමාධ්‍යයන්ට, දේශපාලනඥයින්ට මෙන්ම ජනතාවට ද තවදුරටත් විහිලුවට කාරණයක් නොවනු ඇත.

මේ රටේ දේශපාලනයට, විශේෂයෙන් පළාත් පාලනයට පිවිසීමට කැමැත්තෙන් සිටින අපගේ දහස් ගණනක් කාන්තාවන්ට ගෞරවාන්විතව දේශපාලන නියෝජකත්වයේ සමානාත්මතාවය භුක්ති විඳීමට ඉඩකඩ ලබා ගත හැකි පරිසරයක් නිර්මාණය කිරීමට කටයුතු කරන ලෙස අපි තවදුරටත් ඉල්ලා සිටිමු.

මෙයට,

කාන්තාව හා මාධ්‍ය සාමූහිකය
ස්ත්‍රී සම්පත් මධ්‍යස්ථානය, කුරුණෑගල
ඌව වෙල්ලස්ස ගොවි කාන්තා සංවිධානය, බුත්තල
කාන්තා සංවර්ධන මධ්‍යස්ථානය, බදුල්ල

---

පිටපත් - අතිගරු ජනාධිපතිතුමා,
ලේකම්තුමා - ශ්‍රී ලංකා නිදහස් පක්ෂය
සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ මන්ත්‍රීවරියන්
සියලුම පලාත් සභා මන්ත්‍රීවරියන්